**දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව**

**කොළඹ දිස්ත්‍රික්කය**

**----------------------**

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 06 දින නගරාධිපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 1.3ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**--------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) නිල රථයක් හා වතුර බවුසරයක් මිලදී ගැනීම සඳහා පිළිවෙලින් රු. 9,850,000 ක් හා රු. 6,000,000 ක් වශයෙන් එකතුව රු. 15,850,000 ක් ගිණුම්වල ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණ ද 2018 අප්‍රේල් 30 දින දක්වා භාණ්ඩ ලැබීමක් හෝ මුදල් ගෙවීමක් සිදු නොකිරීම නිසා එම වටිනාකමින් ණයහිමියන් හා ප්‍රාග්ධන වියදම් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) බහු කාර්ය ලීවර යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා රු.1,726,085 ක මුදලක් ගිණුම්වල ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණ ද 2018 අප්‍රේල් 30 දින වන විටත් ඇණවුම නිකුත් කිරීමක්, භාණ්ඩ ලැබීමක් හෝ මුදල් ගෙවා නොතිබූ බැවින් එම වටිනාකමින් ණයහිමියන් හා ප්‍රාග්ධන වියදම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ගලි බවුසර් සේවාවෙන් වර්ෂ අවසානයට ලැබිය යුතු ආදායම ගිණුම්ගත කිරීමේදී අනෙකුත් ගාස්තු රහිතව ණයගැති වටිනාකම පමණක් ගිණුම්ගත කර තිබූ අතර මුදල් අයකිරීමේදී ලබාගන්නා අනෙකුත් ගාස්තු සමුච්චිත අරමුදලට බැර කර තිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට සේවක ණය වැඩිපුර අයවීම් රු. 258,339 ක් වූ නමුත් එම ශේෂය ශේෂ පත්‍රයේ ජංගම බැරකම් යටතේ දක්වා නොතිබූ බැවින් එම ප්‍රමාණයෙන් ජංගම බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සම්ප්‍රේෂණ කුළුණු ආදායම වරිපනම් බදු ආදායම යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් ක්ෂය වටිනාකම රු. 14,292,022 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) බාහිර පාර්ශවයන් විසින් 2013 හා 2015 වර්ෂවල සභාවට පවරාදී තිබූ වාහන 4 ක වටිනාකම් තක්සේරුකර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඌ) ගලිබවුසර් සේවා ආදායම් ලේඛනය අනුව (හිඟ) ගලිබවුසර් සේවා ආදායම රු.638,545 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.464,545 ක් ලෙස දක්වා තිබූ බැවින් මූල්‍ය ප්‍රකාශනවල රු.174,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ කසළ ඉවත් කිරීම වෙනුවෙන් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට ගෙවා තිබූ මුදල රු.57,093,145 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එම වියදම රු.62,766,562 ක් ලෙස දක්වා තිබූ බැවින් මූල්‍ය ප්‍රකාශනවල රු.5,673,417 ක් වැඩියෙන් දක්වා තිබුණි.

**1.3.2 අසම්භාව්‍ය බැරකම්**

---------------------

(අ) බාහිර පාර්ශවයන් විසින් මහා නගර සභාවට එරෙහිව නඩු 33 ක් පවරා ඇති අතර සභාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව නඩු 21 ක් පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් ගෙවීමට සිදුවන වන්දි මුදල් සම්බන්ධයෙන් ශේෂ පත්‍ර දිනට හෙළිදරව් කර නොතිබුණි.

(ආ) බර්න්ස් සමාගම සම්බන්ධයෙන් වාණිජ මහාධිකරණ තීරණයට එරෙහිව සභාව විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා තිබූ නඩුවට අදාළව විශාල වන්දි මුදලක් බර්න්ස් සමාගම ඉල්ලුම් කර තිබූ අතර ඒ සඳහා නීතිඥ ගාස්තු ලෙස රු. 1,201,333 ක මුදලක් මේ වන විට ගෙවා තිබුණි.

**1.3.3 නොසැසඳුණු ගිණුම්**

----------------------

**පහත දැක්වෙන නොසැසඳීම් නිරීක්ෂණය විය.**

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 11 කට අදාල ශේෂයන් ඒවාට අදාළ උපයෝගී ලේඛන/ වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී රු.31,071,253 ක වෙනසක් පැවතුණි.

(ආ) පළාත් සභා ආධාර ණයගැති ශේෂය ලෙජර් ගිණුම හා උපලේඛන අනුව රු.8,520,625 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව රු.8,619,098 ක් වූයෙන් රු.98,473 ක වෙනසක් පැවතුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

**(අ) ලැබිය යුතු ගිණුම්**

------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2002 සිට 2017 වර්ෂය දක්වා ආදායම ලෙස ලබාගෙන තිබූ රු. 836,274 ක් වටිනා චෙක්පත් 30 ක් අගරු වී තිබූ නමුත් ඒ සඳහා මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2008 සිට 2017 දක්වා කාලපරිච්ඡේදයට අදාලව ආයතන 14 කින් අයවිය යුතු ගලිබවුසර් ආදායම රු. 272,545 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2006 හා 2007 කාලපරිච්ඡේදයට අදාල රු.121,456 ක් වූ නොපියවූ දේපළ ණය පොලී අත්තිකාරම් ශේෂය පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) 2013, 2014 හා 2015 යන වර්ෂවලට අදාල හිඟ සහික දීමනා රු.1,827,000 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(v) 2013 සිට 2017 දක්වා කාලපරිච්ඡේදයට අදාළ වැටුප් රු.133,533,581 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු. 12,503,298 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

උපලේඛන, ශේෂ සනාථන හා ගිවිසුම් යනාදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.11,297,740 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | (රු.) | |
| (අ) | මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 218 වගන්තිය | - | සභාවේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් සහ ලැබීම් හා ගෙවීම් පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| (i) | xix වැනි පරිච්ඡේදයේ | | |
| | ❖ I වන වගන්තිය | - | රජයේ නිවාස උප ලේඛනගත හා පොදු සේවා නිවාස යනුවෙන් වර්ග කර නොතිබුණි. |
| | ❖ 4.2.1 වගන්තිය | - | නිලධාරීන් තෝරා ගැනීම සඳහා නිවාස වෙන්කර දෙන බලධාරියා විසින් 18 වැනි පරිශිෂ්ඨය අනුව ලකුණු දීමේ ක්‍රමයක් සකස් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | ❖ 4.3.4. වගන්තිය | - | එක් එක් නිවාස ශ්‍රේණිය සඳහා වෙනම පොරොත්තු ලේඛනයක් නඩත්තුකර නොතිබුණි. |
| (ii) | xxiv වැනි පරිච්ඡේදයේ 13.6 වගන්තිය | - | මාස 12 ක කාල සීමාවක් සඳහා උත්සව අත්තිකාරම් ගෙවිය හැක්කේ එක් වරක් පමණක් වුවද එයට පටහැනිව කලින් ගත් ණය මුදල් සම්පූර්ණයෙන් අයකර නොතිබියදී සභාවේ සේවකයන් සඳහා උත්සව අත්තිකාරම් ලබා දී තිබුණි. |

(ඇ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u>

| | | | |
|---|---|---|---|
| (i) | මු.රෙ.104(3) හා (4) | - | 2017 වර්ෂයේ සිදුවූ වාහන අනතුරු 03 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක හා පූර්ණ වාර්තා සකස්කර නොතිබුණි. |
| (ii) | මු. රෙ. 110 | | [[[ හානි හා පාඩු ලේඛනයක් නඩත්තුකර නොතිබුණි. |
| (iii) | මු.රෙ. 188 (2) | 48,681 | තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 5 ක් හා මුදල් ඇණවුම් 2 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. |
| (iv) | මු.රෙ. 341 | - | උප පත්‍රිකා පොත් පිළිබඳ විස්තර ජී.ඒ.එන් 20 ආකෘතිය ප්‍රකාරව ලේඛනයක සටහන් කර නොතිබූ අතර පොත් වර්ගය අනුව ලේඛනයේ වෙන වෙනම කොටස් වෙන්කර නොතිබුණි. |
| (v) | මු.රෙ. 342 (1) | - | උපපත්‍රිකා පොත් අංක අනුපිළිවෙලට ආරක්ෂිතව ගබඩා කර නොතිබුණි. |
| (vi) | මු.රෙ. 371(2) (ඇ) හා 371(5) | 1,558,187 | ලබාගත් අතුරු අග්‍රිමයන් කාර්යය නිමකළ වහාම පියවිය යුතු වුවද ලබාගත් |

| | | | |
|---|---|---|---|
| | | | අත්තිකාරම් විශාල කාල ප්‍රමාදයක් සහිතව පියවා තිබීම මෙන්ම වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර නිරවුල් නොකළ අවස්ථා තිබුණි. |
| (vii) | මු.රෙ.396 (ඇ) | 35,550 | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ වලංගු කාල සීමාව ඉක්ම වූ චෙක්පත් 18 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (viii) | මු.රෙ. 1653 | - | වාහනවල මයිලෝමීටරය ක්‍රියාවිරහිත වූ විට ඉක්මනින් අලුත්වැඩියා කරගත යුතු වුවද දීර්ඝ කාලයක සිට මයිලෝමීටර අක්‍රීය වූ වාහන 50 ක් සභාවේ තිබුණි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3:1 ඡේදය | - | සභාව සතු වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | - | පරිගණක හා මෘදුකාංග සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

**1.3.7 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

මහා නගර සභා ආඥා පනතේ 188(1) වගන්තියට පටහැනිව මාසික මහා සභා රැස්වීමට සහභාගි වන නිලධාරීන්ට නිල ඇඳුම් ලබාදීම වෙනුවෙන් 2013,2014 හා 2015 වර්ෂ සඳහා ගෙවා තිබූ මුදල රු.725,000 ක් විය.

## 2 මූල්‍ය සමාලෝචනය

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.341,690,299 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.349,470,297 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තු ගත ආදායම් | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තු ගත ආදායම | 2016 බිල්කළ ආදායම | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | (රු). '000 | (රු). '000 | (රු). '000 | (රු). '000 | (රු). '000 | (රු). '000 | (රු). '000 | (රු). '000 |
| වරිපනම් හා බදු | 365,100 | 686,095 | 243,364 | 343,178 | 357,300 | 363,007 | 202,934 | 3,519 |
| බදු කුලී | 29,747 | 27,975 | 10,862 | 15,085 | 19,574 | 17,966 | 13,752 | 9,845 |
| බලපත්‍ර ගාස්තු | 34,235 | 94,318 | 18,893 | 62,782 | 31,235 | 40,546 | 20,232 | 33,296 |
| වෙනත් ආදායම් | 433,815 | 355,995 | 320,332 | 173,227 | 365,507 | 406,242 | 356,794 | 413,704 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

2017 වර්ෂයේ අයවැයගත පුනරාවර්තන ආදායමෙන් රු. 51,463,446 ක් උපයා ගැනීමට සභාව අපොහොසත් වී තිබූ අතර අයවැයගත ප්‍රාග්ධන ආදායම ඉක්මවා රු.12,800,000 ක් උපයාගෙන තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

(අ) වරිපනම්

(i) සමාලෝචිත වර්ෂය සඳහා බිල් කරන ලද වරිපනම් බදු රු.367,408,597 ක් වුවද ඉන් රු.132,912,366 ක් හෙවත් සියයට 36 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ii) 2016 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු.306,489,840 ක් වුවද ඉන් සමාලෝචිත වර්ෂය තුළ දී රු.109,008,030 ක් හෙවත් සියයට 36 ක් අයකරගෙන තිබීමෙන් හිඟය රු. 197,481,810 ක් විය.

(iii) 2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු.357,578,962 ක් වූ අතර ඉන් රු.100,000 ක් ඉක්ම වූ වරිපනම් ඒකක 396 කින් රු.140,499,759 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) රු.100,000 ඉක්ම වූ හිඟ ශේෂයන් පවතින රාජ්‍ය ආයතන සමාලෝචිත වර්ෂය සඳහා ද වරිපනම් බදු නොගෙවීම නිසා වාර්ෂිකව වරිපනම් ශේෂය වර්ධනය වී තිබුණි.

(v) 2017 වර්ෂයේදි වරිපනම් බදු සඳහා ලැබුණු චෙක්පත් 47 ක් අගරු වී තිබුණ අතර ඉන් රු.2,171,626 ක් වටිනා චෙක්පත් 19 ක් සඳහා නැවත මුදල් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කසළ බදු

(i) සභාව විසින් කසළ ඉවත් කරනු ලබන ව්‍යාපාරික ස්ථාන සමඟ ගිවිසුම් ගත වී නොමැති බැවින් හිඟ කසළ ගාස්තු අයකිරීමේ දී නීත්‍යානුකූලව කටයුතු කල නොහැකිව තිබූ අතර 2003 නොවැම්බර් 18 දිනැති අංක 08 (10) 35 දරන සභා තීරණය හා මුදල් කාරක සභාවේ උපදෙස් පරිදි හිඟ කසළ ගාස්තු

අයකිරීමට කටයුතු නොකිරීම නිසා 2017 දෙසැම්බර් 31 දිනට හිඟ කසළ ආදායම රු.9,768,276 ක් විය.

(ii) පසුගිය වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද හිඟ ශේෂයන් පැවති ආයතන 173 කට සමාලෝචිත වර්ෂයේදී ද කසළ ඉවත් කිරීමේ සේවාව ලබා දී තිබූ අතර 2017 වර්ෂයේදී ද හිඟ ගෙවීම් හෝ වර්ෂයට අදාළ මුදල් හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වෙනත් බදු

-------------

2017 දෙසැම්බර් 31 දිනට හිඟ කේබල් ටී.වී ආදායම රු.3,594,953 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 කුලී**

**-----**

2014 වර්ෂයට පෙර සිට පැවත එන ලැබිය යුතු මිශ්‍ර ආදායම් ශේෂය තුළ ඇතුලත් මස් කඩකුලී හිඟ ශේෂය වූ රු.2,471,517 ක් හඳුනා ගෙන අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

**2.2.5 බලපත්‍ර ගාස්තු**

----------------

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බිල් කරන ලද ව්‍යාපාර බදු ආදායම රු.38,237,000 ක් වුවද ඉන් රු.29,867,980 ක් හෙවත් සියයට 78 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට හිඟ ව්‍යාපාර බදු ශේෂය රු.32,395,547 ක් වුවද ඉන් සමාලෝචිත වර්ෂය තුළදී රු.4,521,543 ක් හෙවත් සියයට 14 ක් අයකරගෙන තිබූ බැවින් රු. 27,874,004 ක් තවදුරටත් හිඟව තිබුණි.

**2.2.6 උසාවි දඩ**

**----------**

2013 සිට 2017 දක්වා කාලපරිච්ඡේදයට අදාළ උසාවි දඩ රු. 143,299,238 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**3.1 කාර්යසාධනය**

**----------------**

මහා නගර සභා ආඥා පනතේ 04 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුව විහරණය පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතු ව තිබූ කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

--------------------------------------

රු. 1,550,750 ක නිම්වැඩ වටිනාකමක් සහිත වින්සර් පාර්ක් පෙර පාසලේ වැඩ 2017 ජූලි 03 දින අවසන් කර තිබුණ ද පෙර පාසලක් ලෙස භාවිතා නොකර නිශ්ක්‍රීයව පැවතුණි.

**(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

2017 වර්ෂය තුළ මහා නගර සභා බල ප්‍රදේශයේ වෙන් නොකරන ලද කසළ ටොන් 33,498 ක් හෙවත් මුළු කසළ ප්‍රමාණයෙන් සියයට 65 ක් වූ අතර කසළ එකතු කිරීම නිසි පරිදි කළමනාකරණය නොකිරීම නිසා මිශ්‍ර අපද්‍රව්‍ය වෙනුවෙන් රු. 25,003,328 ක් වැඩිපුර ගෙවීමට සභාවට සිදුවී තිබුණි.

**(ඇ) අත්හැර දැමූ කර්තව්‍යයන්**

විමධ්‍යගත ආධාර යටතේ ක්‍රියාත්මක කළයුතු රු. 499,928 ක් වටිනා ව්‍යාපෘතියක් හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළයුතු රු. 9,250,000 ක් වටිනා ව්‍යාපෘති 02 ක් අවලංගු කර තිබුණි.

**(ඈ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

සභා අරමුදල් යටතේ ක්‍රියාත්මක කළයුතු රු. 70,260,140 ක් වටිනා ව්‍යාපෘති 08 ක වැඩ අවසන් කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

**(අ) සැලසුම් අනුමත කිරීම හා අනුකූලතා සහතික නිකුත් කිරීම**

(i) ඉල්ලුම් කරන ලද අනුකූලතා සහතික හා නිකුත් කරන ලද අනුකූලතා සහතික පිළිබඳ විස්තර අඩංගු ලේඛනයක් නඩත්තු කර නොතිබුණු බැවින් ඉල්ලුම්කරන ලද අනුකූලතා සහතික අප්‍රමාදව නිකුත් කළ බව තහවුරු කරගත නොහැකි වූ අතර 2014, 2015 හා 2016 වර්ෂවල ඉල්ලුම් කරන ලද අනුකූලතා සහතික විශාල කාල ප්‍රමාදයක් සහිතව 2017 වර්ෂයේදී නිකුත් කර තිබුණි.

(ii) අනුකූලතා සහතික ඉල්ලුම් කිරීමේදී සභාවට අයදුම්පත්‍ර ලැබුණු දිනය සනාථ වන පරිදි දින මුද්‍රාව තබා නොතිබීම නිසා අප්‍රමාදව නිකුත් කිරීම් සිදු වන්නේද යන්න තහවුරු කරගත නොහැකි විය.

(iii) නිකුත් කරන ලද අනුකූලතා සහතිකවල පිටපත් ඉදිරි කටයුතු සඳහා අදාල අංශ වෙත යොමු කර නොතිබූ අවස්ථා මෙන්ම අනුමත කළ අනුකූලතා සහතිකවල මුල් පිටපත් අදාළ පුද්ගලයින් වෙත ලබා නොදුන් අවස්ථා ද නිරීක්ෂණය විය.

**(ආ) තක්සේරු ආදායම**

2017 වර්ෂය සඳහා ඉඩම් හා ගොඩනැගිලි අයිතිකරුවන්ගේ නම් හා ලිපිනයන් ලියාපදිංචි කිරීමේ ගාස්තු පැනවීම සඳහා 2016 නොවැම්බර් 04 දිනැති අංක 1992 දරන ගැසට් පත්‍රය අඩුපාඩු හා පරස්පරතා සහිතව ප්‍රසිද්ධ කර තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

2017 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 17 | 6 | - |
| තෘතියික මට්ටම | 12 | 6 | 6 | - |
| ද්විතීය මට්ටම | 342 | 292 | 50 | - |
| ප්‍රාථමික මට්ටම | 1398 | 1310 | 88 | - |
| වෙනත් (අනියම්) | - | 30 | - | 30 |
| එකතුව | 1775 | 1655 | 150 | 30 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 150 ක් පැවතුණි.

(ආ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක පුරප්පාඩු පැවතීම හේතුවෙන් සභාවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායිව ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව බඳවාගෙන ස්ථිර පත්වීම් ලබාදී තිබූ සේවකයකු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවීම නිසා එම පුද්ගලයා සඳහා ගෙවා තිබුණ වැටුප ප්‍රතිපූර්ණය කර ගැනීමට සභාවට නොහැකි වී තිබුණි.

(ඈ) අනුමත සේවකයන්ට අමතරව සභාවේ අවශ්‍යතා වෙනුවෙන් අනියම් පදනම මත 2017 වර්ෂයේදී සෞඛ්‍ය කම්කරුවන් 30 දෙනෙකු හා 2013 හා 2014 වර්ෂවල දෛනික පදනම මත සේවකයන් දෙදෙනෙකු බඳවාගෙන තිබුණි.

(ඉ) 2017 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබූ සේවක ණය රු.6,783,961 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) රියදුරු පුරප්පාඩු 07 කට බඳවා ගැනීම සඳහා 2017 ඔක්තෝබර් මස රු.416,806 ක වියදමක් දරා පුවත්පත් දැන්වීම් පල කර තිබූ නමුත් අයදුම්පත් එවීම සඳහා ලබා දී තිබූ දින 14 ක කාලය ප්‍රමාණවත් නොවීම නිසා නැවත දින දීර්ඝ කිරීම වෙනුවෙන් රු.18,078 ක අමතර වියදමක් දරා තිබූ අතර තිදෙනෙකු පමණක් බඳවා ගෙන තිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-----------------------------[**

**(අ) වෙළඳ ස්ථාන කුලී**

--------------------

(i) සභාව සතු කඩකාමර 371 කින් 239 ක කුලී හිඟව පැවතුන අතර බොහෝ කඩ කාමර බදු දී තිබුණද බදුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබුණි. එමෙන්ම සමහර ගිවිසුම්වල ගිවිසුම්ගත කාලය ඉක්ම ගොස් තිබුණද නැවත ගිවිසුම් අලුත් කිරීමට කටයුතුකර නොතිබුණි.

(ii) කුලී ගිවිසුම් ප්‍රකාරව අඛණ්ඩව මාස 03 ක කුලී නොගෙවන කඩහිමියන් සම්බන්ධයෙන් සභාව කටයුතුකර නොතිබුණු අතර කඩහිමියන්ගේ නම් ලියාපදිංචිකර ගැනීමට කටයුතුකර නොතිබුණි. එමෙන්ම කඩකාමර 11 ක් ව්‍යාපාර කිරීමෙන් තොරව වසා දමා තිබුණි.

**(ආ) එස්. ද. එස්. ජයසිංහ ශ්‍රවනාගාරය**

-------------------------------------

(i) එස්. ද. එස්. ජයසිංහ ශ්‍රවනාගාරය A ශාලාවේ ෆයිබර් ග්ලාස් පුටු 700 කට වැඩි ප්‍රමාණයක් පැවතුණද සමහර ස්ථානවල පුටු කැඩී තිබුණු අතර වායු සමීකරණය කරන ලද ශාලාවේ සමහර දොරවල්ද කැඩී තිබුණි. එමෙන්ම වේදිකා විදුලි ආලෝක කට්ටලය ක්‍රියා විරහිතව තිබුණු අතර පියගැට පෙලේ විදුලි ලාම්පු අලුත්වැඩියා කළයුතු තත්ත්වයේ පැවතුණු අතර ශාලාවේ ප්‍රධාන තිරය ඇතැම් අවස්ථාවලදී වැසීමට අපහසු තත්ත්වයක් පැවති අතර වැසිකිළි බඳුන් කැඩී අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජූලි දක්වා ශ්‍රවනාගාරයේ ආදායම රු. 1,938,735 ක් වූ අතර ශ්‍රවනාගාරය පවත්වාගෙන යාම වෙනුවෙන් සභාවට දැරීමට සිදුවූ තිබූ වියදම අතිකාල හැර රු. 2,999,221 ක් විය. ඒ අනුව ආදායම ඉක්ම වූ වියදම රු. 1,060,486 ක් විය.

(iii) ශ්‍රවනාගාරයේ 2016 වර්ෂය සඳහා විදුලි ගාස්තුව රු. 3,883,005 ක් වූ අතර එම කාලපරිච්ඡේදයේ උපයා තිබූ මුළු ආදායම රු. 3,542,757 ක් විය. තවද 2017 වර්ෂයේ මාර්තු සිට ජූලි දක්වා ලැබූ ආදායම ශ්‍රවනාගාරයේ ඒ ඒ මාසවල විදුලි බිල පියවීමට තරම් හෝ ප්‍රමාණවත් නොවීය.

**(ඇ ) පෙර පාසල් කළමනාකරණය**

---------------------------------

(i) 2013 සැප්තැම්බර් 04 දිනැති අංක 1826/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ iv වැනි කොටස මගින් ප්‍රසිද්ධ කරන ලද බස්නාහිර පළාත් සභාවේ 2013 අංක 01 දරන පෙර පාසල් ප්‍රඥප්තියේ 13 වගන්තිය ප්‍රකාරව පළාත තුළ සියළු පෙර පාසල් මේ යටතේ ලියාපදිංචි කළ යුතු වුවද පෙර පාසල් 07 ක් එසේ ලියාපදිංචි කර නොතිබූ අතර ප්‍රඥප්තියේ vii වැනි කොටස ප්‍රකාරව පෙර පාසල් ගුරුවරියන් ලියාපදිංචි කර හැඳුනුම්පත් නිකුත් කළ යුතු වුවද සභාව විසින් පවත්වාගෙන යන පෙර පාසල්වල සේවය කරන ගුරුවරුන් 08 දෙනෙක් එසේ ලියාපදිංචි කර නොතිබුණි.

(ii) ඉහත ප්‍රඥප්තියේ 12 (1) ඌ වගන්තිය ප්‍රකාරව පෙර පාසල් ලියාපදිංචි කිරීමේදී සුදුසුකම් සහිත ගුරුවරයෙක් සඳහා ශිෂ්‍යයන් 20 ක් පමණක් වන පරිදි පෙර පාසල් පවත්වා ගතයුතු වුවද සභාවේ පෙර පාසල් 5 ක ගුරුවරියක් සඳහා ශිෂ්‍ය සංඛ්‍යාව 24 ත් 35 ත් අතර පරාසයකින් යුක්ත විය.

(iii) ඉහත ප්‍රඥප්තියේ v වැනි කොටසෙහි පෙර පාසල් සඳහා වන ප්‍රමිතීන් අනුව තිබිය යුතු මූලික හා අවම පහසුකම් නොමැතිව එනම් 12(1) (ඇ) පරිදි ආරක්ෂිත තාප්පයකින් හෝ ආරක්ෂිත වැටකින් පෙර පාසල් භූමිය ආරක්ෂාකර නොතිබීම, 12(1) (ඊ) පරිදි පෙර පාසල්වල ක්‍රීඩා

කිරීම සඳහා පහසුකම්/ඉඩකඩ නොතිබීම, 12(1) (උ) පරිදි පෙර පාසල් භූමිය ප්‍රසන්න පරිසරයකින් සකස්කර නොතිබීම හා මූලික ක්‍රීඩා උපකරණවලින් සමන්විත නොවන පරිදි පෙර පාසල් පවත්වාගෙන ගොස් තිබුණි.

(ඈ) **සුසානභූමි හා ආදාහනාගාර**

(i) ගල්කිස්ස, කොහුවල, නැදිමාල හා අත්තිඩිය සුසානභූමිවල වටිනාකම සහ වපසරිය ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයේ සටහන් කර නොතිබුණු අතර සුසානභූමිවල අයිතිය තහවුරු කර ගැනීමට අවශ්‍ය පවරා ගැනීම් විස්තර, ඔප්පු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය සහ 2009 මිනින්දෝරු අනුරේඛනය අනුව වපසරිය වෙනස් වීමට හේතු නිරීක්ෂණය නොවූ අතර වත්කම් ලේඛනයද යාවත්කාලීන කර නොතිබුණි.

(iii) භූමදාන හා ආදාහන බලපත්‍ර පොත් ගබඩාවෙන් සෞඛ්‍ය අපද්‍රව්‍ය අංශය වෙත ලැබීමේදී හා ඒවා නැවත නිකුත් කිරීමේදි විධිමත්ව ලේඛනගත කර නොතිබුණි.

(iv) ලිඛිත අවසරයකින් තොරව මරණ සහතිකයේ සඳහන් ආකාරයට නොමැතිව මරණයේ කටයුතු සිදුකිරීම, බලපත්‍රයෙහි මුල් පිටපත් ගොනුවට ඇතුළත් නොකිරීම, සුසාන භූමියේ පවතින ලේඛනවල ආදාහන කටයුතු පිළිබඳ ඇතුලත් නොකිරීම ආදි අභ්‍යන්තර පාලන දුර්වලතා නිසා ගාස්තු අය කිරීමේ නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය.

3.5 **වත්කම් කළමනාකරණය**

**3.5.1 නිශ්ක්‍රිය/ ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු කම්පැක්ටර් රථ 02 ක් වර්ෂයකට අධික කාලයක සිට අලුත්වැඩියා කළයුතු තත්ත්වයේ අක්‍රියව පැවතුණු අතර 2018 අප්‍රේල් 30 දින වන විටත් අලුත්වැඩියාකර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වසා දමා තිබූ කඩ කාමර 11 ක් හා මුද්‍රා තබා ඇති කඩ කාමර 37 ක් නැවත පවරාගෙන වෙනත් බදුකරුවන් වෙත බදු දී ආදායම් ඉපයීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සතු ස්නෝකල් රථයක් 2017 ජනවාරි සිට ක්‍රියා විරහිතව පැවති අතර 2018 අප්‍රේල් දක්වා අලුත්වැඩියා කර නොතිබුණි.

(ඈ) රු. 171,352 ක අත්තිකාරමක් ගෙවා ගල්කිස්ස ගාලු පාර, අංක 368 දරන නගර සභා දෙමහල් ගොඩනැගිල්ල අලුත්වැඩියා කර තිබුණ ද සභාවට කිසිදු ආදායමක් ලබා නොගෙන නිශ්ක්‍රියව පැවතුණි.

(ඉ) කාලයක සිට නිකුත් නොවන සහ කල් ඉකුත් වූ රු. 127,530 ක් වටිනා නිල ඇඳුම් හා රු. 66,360 ක් වටිනා විදුලි භාණ්ඩ ගබඩාවේ පැවතුණි.

(ඊ) වර්ෂ 01 ක සිට වර්ෂ 06 ක කාලසීමාවක් තුළ ධාවනයෙන් ඉවත් කර තිබූ වාහන 14 ක් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

3.5.2 වාහන උපයෝජනය

(අ) නාගරික කොමසාරිස්වරයා වාහන 02 ක් භාවිතා කර තිබූ අතර අතිරේකව පාවිච්චි කළ වාහනය සඳහා ජනවාරි සිට දෙසැම්බර් දක්වා යෙදවූ ඉන්ධන ලීටර් 2283 ක් වෙනුවෙන් රු. 251,130 ක් වැයකර තිබුණි.

(ආ) භාවිතා කරන වාහන 158 සඳහා ස්ථිර රියදුරන් 85 ක්, කම්කරුවන් 36 ක් හා යන්ත්‍ර ක්‍රියාකරුවන් 2 ක් සිටින නමුත් වාහන 35 ක් සඳහා රියදුරන් පුරප්පාඩුව පැවතුණි.

(ඇ) 2014 වර්ෂයේ සිදු වූ වාහන අනතුරු 03 කට අදාලව රක්ෂණ වන්දි ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ගිලන් රථයකට 2017 පෙබරවාරි 02 දින සිදු වූ අනතුරින් වූ අලාභයේ වටිනාකම රක්ෂණය මඟින් ප්‍රතිපූර්ණය කරගැනිමෙන් පසු ඉතිරි මුදල වූ රු.490,070 ගිලන් රථයේ රියදුරුගෙන් අයකරගැනීමට නිර්දේශ කර තිබුණද 2017 දෙසැම්බර් 31 දිනවන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2016 හා 2017 වර්ෂවල හදිසි අනතුරුවලට ලක්වූ වාහන 03 ක් අළුත්වැඩියා කිරීම සඳහා රු.636,561 ක් වැයකර තිබුණ අතර රක්ෂණ වන්දි ලබාගැනීම හැර නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුවෙන් රජයට සිදුවූ අලාභ ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු නොකිරීම නිසා රු. 100,151 ක පාඩුවක් සභාවට සිදුවී තිබුණි.

(ඊ) සභාව සතුව වාහන 245 ක් පැවතියද ට්‍රැක්ටර් රථ 04 ක්, ලොරි රථ 1 ක් ,වෑන් රථ 08 ක්, කාර් 2 ක් හා ත්‍රීවිල් 04 ක් කුලී පදනම මත ලබාගෙන තිබුණු අතර කුලියට ලබාගත් වාහන 19 සඳහා 2017 වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා රු.12,283,180 ක මුදලක් කුලී වශයෙන් ගෙවා තිබුණි.

(උ) ඇතැම් ට්‍රැක්ටර්වල ධාවන සටහන් නිසි පරිදි සම්පූර්ණ කර නොතිබුණු අතර ඇතැම් ට්‍රැක්ටර්වල ධාවනය හා ගතකළ කාලය ඉතාම අඩු මට්ටමක පැවතීම හා ඇතැම් දිනවල රියදුරන් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීම හා පිටවීම සටහන් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඌ) ධාවනයේ යෙදවීම නිසි පරිදි කළමණාකරණය නොකිරීම හේතුවෙන් කුලී පදනම මත ලබාගන්නා ඇතැම් වාහන, ධාවනය කළ යුතු අවම කාලය ධාවනය නොකිරීම හා ඇතැම් වාහන ධාවනය කළ යුතු කාලය ඉක්මවා ධාවනය කිරීම නිසා සභාවට අතිරේක වියදම් දැරීමට සිදුව තිබුණි.

**3.6 ආර්ථික නොවූ ගනුදෙනු**

(අ) නිල නිවාසවල විදුලි හා ජල බිල්පත් පියවීම සම්බන්ධව නිසි අධීක්ෂණයක් නොකිරීම නිසා අනගාරික ධර්මපාල මාවතේ අංක 14 ස්ථානයේ පිහිටි නිල නිවසෙහි හිඟ ජල බිල්පත් වෙනුවෙන් රු.87,844 ක මුදලක් සභාව විසින් ගෙවා තිබූ අතර එය නිවැසියාගෙන් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අංක 04 උද්‍යාන පාර නිල නිවාසය 2015 සැප්තැම්බර් 01 දින සිට 2016 සැප්තැම්බර් 27 දින දක්වා වසා දමා තිබුණු අතර ජල කාන්දුවක් හේතුවෙන් එම කාලයට අදාළ ජල බිල්පත වශයෙන් රු.4,710 ක මුදලක් සභාවට ගෙවීමට සිදු වී තිබුණි.

(ඇ) නිල නිවාසවල පදිංචිකරුවන් විසින් නිල නිවසේ ජල හා විදුලි ගාස්තු ගෙවිය යුතු වුවද පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් පදිංචි නිල නිවාස 05 ක් සඳහා වෙන් වෙන්ව ජල හා විදුලි මනු සවිකර නොතිබුණු බැවින් එම නිවාසවල ජල හා විදුලි බිල්පත් සභාව විසින් ගෙවීම් කර තිබුණි.

(ඈ) දෙහිවල මධ්‍යම පුස්තකාලය නවීකරණය කිරීම් ව්‍යාපෘතියේදී කොන්ත්‍රාත්කරුගෙන් අය කළයුතු ජල හා විදුලි ගාස්තු රු. 409,294 ක් අය නොකර රඳවුම් මුදල සම්පූර්ණයෙන් නිදහස් කර තිබුණි.

(ඉ) ගල්කිස්ස ගාලු පාර අංක 368 දරන නගර සභා දෙමහල් ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සඳහා 2016 නොවැම්බර් 28 දින ගිවිසුම්ගත වී 2017 ජනවාරි 16 දින රු. 171,352 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. එහෙත් 2017 ජනවාරි 31 දින වන විට නිම කළ යුතු වැඩ 2017 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබූ අතර මේ සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.7 හඳුනාගත් පාඩු**

-------------------

2011 නොවැම්බර් 11 දින සිට 2016 අප්‍රේල් දක්වා සේවය අත්හිටවූ සේවකයකු වෙනුවෙන් රු.1,413,903 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම මුදල් ආපසු අයකර ගෙන නොතිබුණි.

**3.8 අවිධිමත් ගනුදෙනු**

--------------------

සති අන්ත හා රජයේ නිවාඩු දිනයන්හි සුසාන භූමි පාලක වෙත භාර දෙන ආදාහන ගාස්තු අයකිරීමේ පොත්පත් ඊළඟ වැඩ කරන දිනයේදී සභාව වෙත භාර දෙන නමුත් මුදල් ලැබීම් ලදුපත් පමණක් පරීක්ෂාකර ආදායමට ගෙන තිබීම නිසා ආදාහන/ භූමිදාන බලපත්‍රයේ සඳහන් මුදල හා ලදුපත් අනුපිටපතෙහි සඳහන් මුදල වෙනස් වීම නිසා රු.35,700 ක මුදලක් සභාවට අහිමි වී තිබුණි.

3.9 **ප්‍රසම්පාදනය**

--------------

3.9.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

2017 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබූ බැවින් අයවැය ලේඛනයට ඇතුලත් කර තිබූ රු. 25,544,085 ක් වටිනා භාණ්ඩ හා සේවා ලබා ගැනීම වර්ෂය තුළ ඉටුකර ගත නොහැකිව තිබුණි.

3.9.2 **සැපයීම් හා සේවා**

--------------------

(අ) වායුසමීකරණ සහිත එන්ජින් ධාරිතාව 1600 CC වැඩි දෙමුහුන් වර්ගයේ මෝටර් රථ ලබාගැනීමට මිල ගණන් කැඳවා තිබුණද තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඊට පටහැනිව එන්ජින් ධාරිතාවය 1330 CC හා 1490 CC වාහන තෝරා ගෙන තිබුණි.පිරිවිතර නිවැරදිව හඳුනා ගැනීමකින් තොරව මිල ගණන් කැඳවීම නිසා වැඩි සැපයුම්කරුවන් සංඛ්‍යාවකට මිල ගණන් ඉදිරිපත් කිරීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

(ආ) ලොරි රථයක් කුලී පදනම මත ගැනීම සඳහා පිරිවිතර නිවැරදිව හඳුනා ගැනීමකින් තොරව මිල ගණන් කැඳවීම නිසා එක් සැපයුම්කරුවකු පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර එම ලොරි රථය ද 1996 වර්ෂයේ ලියාපදිංචි කරන ලද වර්ෂ 20 කට වඩා පැරණි හා ට්‍රැක්ටරයක පැටවුම් බරට වඩා අඩු පැටවුම් බරකින් යුක්ත බැවින් කමිටු තීරණය ප්‍රශ්නගත විය.

(ඇ) වෑන් රථ කුලියට ගැනීම සඳහා මිල ගණන් කැඳවීමේ කොන්දේසි අනුව වෑන් රථ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර අවුරුදු 10 ක් ඇතුළත විය යුතු වුව ද ඊට පටහැනිව සභාව විසින් 1997 වර්ෂයේ සිට 2005 දක්වා ලියාපදිංචි කළ වාහන 05 ක් කුලියට ලබා ගෙන තිබුණි.

(ඇ) භාණ්ඩ ප්‍රවාහන ට්‍රැක්ටර් රථ කුලියට ගැනීම සඳහා මිල ගණන් කැඳවීමේ කොන්දේසි අනුව පැටවිය හැකි බර ටොන් 3.5 ක් විය යුතු වුවද ඊට පටහැනිව පැටවිය හැකි බර ටොන් 1.5 කින් යුක්ත වාහන 02 ක් කුලියට ගෙන තිබුණි.

(ඉ) පෞද්ගලික ආරක්ෂක සේවා ලබාගැනීමට අදාල ගිවිසුමේ කොන්දේසි අංක 11 පරිදි හා මිල ගණන් කැඳවීම් පුවත්පත් දැන්වීම අනුව සේවයේ යොදවනු ලබන ආරක්ෂක නිලධාරීන්ගේ වයස් සීමාව අවුරුදු 18 ට වැඩි 55 ට අඩු විය යුතු වුවත් මෙම වයස් සීමාව ඉක්ම වූ සේවකයින් 11 දෙනෙකු ආරක්ෂක සේවයේ යොදවා ගෙවීම් කර තිබුණි.

3.9.3 **කොන්ත්‍රාත් පරිපාලනය**

(අ) වැඩ අවසන් කළ ව්‍යාපෘති සඳහා සතුටුදායක ලෙස වැඩ නිම කර ඇති බවට නිර්දේශ කළ සහතිකයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) කොහුවල වෙළඳ සංකීර්ණයේ සතොස අලෙවිසැල තුළට වැහි වතුර ගලා ඒම සහ ප්‍රධාන දොරටුවේ දොර නිසි ආකාරයට සවි කර නොතිබියදී මෙම අලුත්වැඩියාව වෙනුවෙන් අදාල කොන්ත්‍රාත්කාර සමිතියට රු. 6,984,130 ක් ගෙවා තිබුණි.

4. **ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**අයවැය පාලනය**

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙන් මහජන සුභසාධනය වෙනුවෙන් වැය විෂයයන් 12 ක් සඳහා වෙන්කර තිබූ රු. 64,350,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) ආදායම් ශීර්ෂ 07 ක් යටතේ ආදායම් විෂයයන් 10 ක් සඳහා අයවැයගත කර තිබූ රු.2,039,000 ක ආදායම්වලින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර කොමසාරිස්වරයාගේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | i. ගිණුම්වලින් අත්හැරීම් තිබීම.<br>ii. ගිණුම්වල අඩුවෙන් හා වැඩියෙන් දැක්වීම් තිබීම. |
| (ආ) | ආදායම් පරිපාලනය | i. හිඟ ආදායම් අය නොවීම.<br>ii. බදු තක්සේරු නිසි කලට සිදු නොකිරීම. |
| (ඇ) | කොන්ත්‍රාත් පාලනය | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කර නොතිබීම. |

| | | |
|---|---|---|
| (ඇ) | අයවැය පාලනය | i. ආදායම් ඇස්තමේන්තු තාත්වික බවකින් යුතුව පිළියෙළ නොකිරීම.<br>ii. ආදායම් වියදම් විෂයයන්වල විශාල වශයෙන් විචලනයන් තිබීම. |
| (ඉ) | ණයගැති, ණයහිමි පාලනය | ශේෂයන් නිරවුල් නොකිරීම. |
| (ඊ) | සේවක ණය කළමනාකරණය | ණය ශේෂයන් ක්‍රමානුකූලව අය නොවීම. |
| (උ) | තොග පාලනය | දිගුකාලයක් නිකුත් නොවන තොග පැවතීම |
| (ඌ) | ස්ථාවර වත්කම් පාලනය | i. වත්කම් නිශ්ක්‍රීයව පැවතීම.<br>ii. ස්ථාවර වත්කම් ගිණුම්ගත නොවීම. |